# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2368/24 - 2024 ජනවාරි මස 24 වැනි බදාදා - 2024.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2018 අංක 35 දරන මුදල් පනත යටතේ වන නිවේදනය**

මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද

2018 අංක 35 දරන මුදල් පනතේ 19 වන වගන්තිය සමග කියවිය යුතු 51 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මම මෙම නියෝගය මගින්, අංක 2334/24 දරන 2023 මැයි මස 31 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙන්* අවසන් වරට සංශෝධනය කරන ලද අංක 2147/72 දරන 2019 ඔක්තෝබර් මස 31 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* නියෝගවල 5 (අ) ඡේදයේ ;

1. ''2022 මැයි 01 සිට 2023 සැප්තැම්බර් 15 දිනෙන් අවසන් වන කාල සීමාව තුළ'' ලෙස සඳහන් වචන සහ ඉලක්කම් සඳහා ''2023 සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මගින් ;
2. ''2023 ඔක්තෝබර් 31'' ලෙස සඳහන් වචන සහ ඉලක්කම් සඳහා ''2024 ජුනි 30'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මගින් ;
3. ''2024 ජනවාරි 31'' ලෙස සඳහන් වචන සහ ඉලක්කම් සඳහා ''2024 සැප්තැම්බර් 30'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීම මගින් ;

සංශෝධනය කරමි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG - 01-0212

1A - PG 6627 — 456 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*